00068

57

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (2015 /1)

## ශ්‍රී ලංකාවේ නීති ක්‍රම (01-II)

කාලය පැය 03 යි.

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.**

---

01 "මෙරට නීති ක්‍රමය තුල ප්‍රමුඛ නීති මූලාශ්‍රයක් ලෙස ක්‍රියාත්මක වන, කාලයක් තිස්සේ මනා ලෙස වර්ධනය වූ අන පනත් පද්ධතිය ඉතා සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරයි". විමසන්න . (ලකුණු 20)

02 "රෝම ලන්දේසි නීතිය අද වන විට මෙරට ශේෂ නීතියක් (residual law) බවට පත් වී ඇත". විමසන්න. (ලකුණු 20)

පහත සඳහන් දෑ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

03 අ). ශ්‍රී ලංකාවේ මුස්ලිම් නීතිය බලපැවැත්වෙන්නේ කවුරුන් හට ද? (ලකුණු 05)

ආ). ශ්‍රී ලංකාවේ තේසවලාමේ නීතිය බලපැවැත්වෙන්නේ කවුරුන් හට ද? (ලකුණු 07)

ඇ.) ශ්‍රී ලංකාවේ උඩරට නීතිය බලපැවැත්වෙන්නේ කවුරුන් හට ද? (ලකුණු 08)

04 අ). මෙරට උසාවි ධූරාවලිය තුල ක්‍රියාත්මක වන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම පිහිටුවනු නොලැබූ උසාවි වර්ග අනුපිළිවෙලින් ලියන්න. (ලකුණු 10)

ආ). ඒවා අතුරෙන් එක් මුල් අවස්ථා අධිකරණයක් (a court of first instance) තෝරා ගෙන එහි අධිකරණ බලය ගැන විස්තරයක් කරන්න.. (ලකුණු 10)

05 වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා ඇති විධිවිධාන ප්‍රකාර ව ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06 විධායක සහ පරිපාලන තීරණ ගන්නා අධිකාරීන් විසින් බලය ඉක්මවා කටයුතු කරනු ලැබූ අවස්ථාවක පුරවැසියෙකුට අධිකරණයෙන් ලබා ගත හැකි රිට් ආඥාවන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 20)

07 කෙටිසටහන් ලියන්න.

| | | |
|---|---|---|
| අ) | ජූරි සභාව | (ලකුණු 05) |
| ආ) | මහ නඩුව | (ලකුණු 05) |
| ඇ) | සාක්කි බලන්ධය | (ලකුණු 05) |
| ඈ) | අධි චෝදනා | (ලකුණු 05) |